සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
Co-operative Employees Commission (Southern Province)
සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්.එච්. දහනායක මාවත, ගාල්ල
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச். தஹநாயக மாவத்தை, காலி.
Planning Secretariat Building (1 st Floor), S.H. Dahanayaka Mawatha, Galle.

මගේ අංකය / எனது இல. / My No. SP/CEC/1/0/5 | ඔබේ අංකය / உனது இல. / Your No. | දිනය / திகதி / Date 2016.07.12

චක්‍රලේඛ අංක 02/2016

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

<u>දකුණු පළාතේ සමුපකාර සේවක වැටුප් වැඩි කිරීම</u>

රජයේ සේවකයන්ට කරන ලද වැටුප් වැඩි කිරීමට සමගාමීව දකුණු පළාතේ සමුපකාර සමිතිවල සේවය කරන සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත සේවකයින්ගේ මූලික වැටුප 2016.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 2500/- (රුපියල් දෙදහස් පන්සිය) කින් වැඩි කිරීමට දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව තිරණය කර ඇති බව දන්වා සිටිමි.

02. මෙහිදී පිරිස්බල තක්සේරුව අනුව කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන ඇති සේවකයින් වෙත පමණක් මෙම වැටුප් වැඩිවීම ගෙවිය යුතු වන්නේය.

03. මෙම නව වැටුප ක්‍රියාත්මක වීමේදී 2008.07.07 දිනැතිව කොමිෂන් සභාව නිකුත් කර ඇති අංක 60/2008 දරණ චක්‍රලේඛයේ සඳහන් වැටුප් පරිමාණ 17 ට අදාළ මූලික වැටුප පමණක් සංශෝධනය වන අතර, ඊට අදාළ පැහැදිලි කිරීම් ඇමුණුම 01 හි දක්වා ඇත.

04. නව වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති, 2012.04.04 දිනැති අංක 63/2012 චක්‍රලේඛයෙන් ගෙවීමට නියම කර ඇති රු. 1500/- අතිරේක දීමනාව ද, 2014.03.31 දිනැති අංක 01/2014 දරණ චක්‍රලේඛයෙන් ගෙවීමට නියම කර ඇති රු. 1200/- ජීවන වියදම් දීමනාව ද, 2015.03.03 දිනැති අංක 01/2015 දරණ චක්‍රලේඛයෙන් ගෙවීමට නියම කර ඇති රු. 2500/- අතිරේක දීමනාව ද, අදාල චක්‍රලේඛ උපදෙස් පරිදි සමුපකාර සේවකයන්ට එලෙසම ගෙවිය යුතුය.

05. පඩිපාලක සභා වැටුප් ලබන හෝ සාමූහික ගිවිසුම් මගින් හෝ අවබෝධතා ගිවිසුම් මගින් වැටුප් තිරණය කරනු ලබන සමුපකාර සමිතිවල සේවය කරන සේවකයින් සඳහා මෙම වැටුප් වැඩිවීම ගෙවිය යුත්තේ අදාළ ආයතන සමඟ එකඟතාවයකට පැමිණිමෙන් පසුවය.

සභාපති / தலைவர் / Chairman 091-2234383 | ලේකම් / செயலாளர் / Secretary 091-2234383 | පරිපාලන නිලධාරී / நிருவாக உத்தியோகத்தர் / Administrative Officer 091-2234279 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091-2234383 | විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail empcommicoopsp@sltnet.lk

06. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට කෙරෙන ගණනය කිරීම් සහ විශ්‍රාම පාරිතෝෂිත දීමනා ගෙවීමේදී නව මූලික වැටුප අදාල කර ගත යුතුය.

07. ඔබ සමිතියේ සියලුම සේවකයින්ට මෙම චක්‍රලේඛයේ සඳහන් විධි විධාන දැන ගැනීමට සැලැස්විය යුතු අතර, නව මූලික වැටුප ඇතුලත් වන පරිදි විධිමත් වැටුප් පරිවර්තන ලිපියක් නිකුත් කළ යුතුය. සමිතියේ පුරප්පාඩු තනතුරුවලට සේවකයින් බඳවා ගැනීමේදී ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීමෙහි ප්‍රතිශෝධිත මූලික වැටුප සහිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය.

08. දකුණු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් /රෙජිස්ට්‍රාර්ගේ එකඟතාවය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි.

එම්.එච්.ටී.ශශිකා දේවප්‍රිය.
ලේකම් (වැ.බ),
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත් - 1. ලේකම් - කෘෂිකර්ම ගොවිජන සංවර්ධන.... සමූපකාර අමාත්‍යාංශ (ද.ප) - දැ.ස.

2. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප) - දැ.ස.

3. දිවයිනේ සියලුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ස.

4. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට

01 වන ඇමුණුම

| වැටුප් පරිමාණ අංකය | අංක 60/2008 දරණ චක්‍රලේඛය පරිදි වැටුප් පරිමාණය | 2016.07.01 දින සිට ක්‍රියාත්මක අංක 02/2016 දරණ චක්‍රලේඛය පරිදි වැටුප් පරිමාණය |
|---|---|---|
| 1 | 15035-350x5-400x6-450x5-21435 | 17535-350x5-400x6-450x5-23935 |
| 2 | 13635-300x5-350x6-400x5-19235 | 16135-300x5-350x6-400x5-21735 |
| 3 | 12175-235x5-325x6-350x5-17050 | 14675-235x5-325x6-350x5-19550 |
| 4 | 11195-225x5-300x6-325x5-15745 | 13695-225x5-300x6-325x5-18245 |
| 5 | 10755-200x6-250x7-300x5-15205 | 13255-200x6-250x7-300x5-17705 |
| 6 | 10315-200x7-250x6-300x5-14715 | 12815-200x7-250x6-300x5-17215 |
| 7 | 9935 -175x7-225x6-250x5-13760 | 12435-175x7-225x6-250x5-16260 |
| 8 | 9715 -150x6-200x8-225x5-13340 | 12215-150x6-200x8-225x5-15840 |
| 9 | 9645 -150x5-200x8-225x5-13120 | 12145-150x5-200x8-225x5-15620 |
| 10 | 9485 -150x5-175x7-200x8-13060 | 11985-150x5-175x7-200x8-15560 |
| 11 | 9265 -150x5-175x7-200x8-12840 | 11765-150x5-175x7-200x8-15340 |
| 12 | 9135 -150x5-175x7-200x8-12710 | 11635-150x5-175x7-200x8-15210 |
| 13 | 8975 -150x5-175x7-200x8-12550 | 11475-150x5-175x7-200x8-15050 |
| 14 | 8845 -150x5-175x7-200x8-12420 | 11345-150x5-175x7-200x8-14920 |
| 15 | 8685 -150x5-175x7-200x8-12260 | 11185-150x5-175x7-200x8-14760 |
| 16 | 8555 -150x5-175x7-200x8-12130 | 11055-150x5-175x7-200x8-14630 |
| 17 | 8025 -125x6-150x7-175x9-11400 | 10525-125x6-150x7-175x9-13900 |